සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# තෙවන වාර පරීක්ෂණය 2020
# නර්තනය - I

10 ශ්‍රේණිය | කාලය පැය 01 යි.

නම/ විභාග අංකයඃ

සැලකිය යුතුයි :
- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 දක්වා ප්‍රශ්න වල දී ඇති 1, 2, 3, 4 පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් උත්තරයේ අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

01. උඩරට, පහතරට, සබරගමු වන්නම් නර්තනයේ දී වඩාත් වැදගත් වනුයේ .................................. චලනය.
(1) සංචාරී (2) තාලානුකූල (3) ප්‍රකාශනාත්මක (4) රිද්මයානුකූල

02. නර්තනයකදී .................................. උපාංග ලෙස ශරීරයේ කොටස් වෙන්කොට දක්වේ.
(1) ගුණාංග අංග (2) ශරීරාංග පංචාංග (3) අංග ප්‍රත්‍යාංග (4) අංග ශරීරාංග

03. අටවන හා දහවන ගොඩ සරඹවල සරඹ නාමයන් .................................. යනුවෙන් නම් කරනු ලැබේ.
(1) අර්ධ චක්‍රය හා බඹර සරඹය. (2) අර්ධ චක්‍රය හා චන්ද්‍රිකා සරඹය.
(3) අර්ධ චක්‍රය හා පැනීම් සරඹය. (4) අර්ධ චක්‍රය හා දැත පෑගීමය.

04. කේරල කලා මණ්ඩලම්හි ඉගැන්වෙන විදේශීය නර්තන සම්ප්‍රදාය .................................. නර්තන සම්ප්‍රධායයි.
(1) භරත (2) මණිපුරි (3) කථක් (4) කථකලී

05. ගම්පල යුගයට අයත් දේශාඨන වාර්තාකරුවකු ලෙස .................................. හැඳින්වේ.
(1) ස්පිල් බර්ජන් (2) රොබට් නොක්ස්
(3) ඉබන්බතුතා (4) පාහියන් භික්ෂුන් වහන්සේ

06. භාතිකාභය රජු බෝධිස්නාන පූජාවක් (නානුමුර මංගල්‍යයක්) මහා බෝධියට පැවැත්වූ බව .................................. සඳහන් වේ.
(1) චූල වංශයේ (2) මහා වංශයේ (3) ථූප වංශයේ (4) බෝධි වංශයේ

07. ''ඉහළට යන කොට පපුවයි දන්නේ'' මෙය .................................. කවියකි.
(1) ඔංචිලි වාරම් (2) රබන් (3) ගොයම් (4) තාලම්

08. පවන් සැලීම සඳහා යොදා ගනුලබන .................................. රාජසභා මෙවලමක් ලෙස හැඳින්විය හැකිය.
(1) සවරම (2) සේසත (3) චාමර (4) සේලය

09. අසාතාත්මක හා අනාසාතාත්මක යන ලක්‍ෂණ දෙකම .................................. ගායනා වල දක්නට ලැබෙන විශේෂත්වයකි.
(1) පතල් කවි (2) නෙළුම් කවි (3) පාරු කවි (4) ටීකා කවි

10. .................................. කාන්තා ලාලිත්‍ය මතුකර පෙන්වන නර්තනයකි.
(1) ලී කෙලි (2) කළගෙඩි (3) කඩු (4) ගොයම්

11. ''හණික වරෙව් කොල්ලනේ'' යන ගීතය අයත් වේදිකා නාට්‍ය වනුයේ,
(1) කැළණි පාලමය. (2) නරිබෑණාය. (3) ගුරුතරුවය. (4) බෙරහඬය.



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

12. ඉලංගම් සරඹ හා දොඹින පද අයත් නර්තන සම්ප්‍රදායන් පිළිවෙලින් මෙසේය,

(1) පහතරට සම්ප්‍රදාය හා සබරගමු සම්ප්‍රදාය. (2) උඩරට සම්ප්‍රදාය හා සබරගමු සම්ප්‍රදාය.

(3) පහතරට සම්ප්‍රදාය හා ද්‍රවිඩ සම්ප්‍රදාය. (4) සබරගමු සම්ප්‍රදාය හා උඩරට සම්ප්‍රදාය.

13. ''තාත් ජිං තත් ......'' යන අඩව්ව නටනු ලබන්නේ,

(1) මාත්‍රා 3 + 4 තාලයටය. (2) මාත්‍රා 2 + 4 තාලයටය.

(3) මාත්‍රා 2 + 3 තාලයටය. (4) මාත්‍රා 3 + 3 තාලයටය.

14. උඩරට, පහතරට හා සබරගමු සම්ප්‍රදායන් හි වන්නම් වල අන්තර්ගත කොටස් පිළිවෙලින් මෙසේය,

(1) 6 කි, 4 කි, 5 කි. (2) 5 කි, 6 කි, 4 කි. (3) 4 කි, 3 කි, 6 කි. (4) 4 කි, 6 කි, 5 කි.

15. ''තත් තත් තක්කඩ කඩතක........'' කස්තිරම නටනු ලබන්නේ,

(1) 10 වන ගොඩ සරඹයටය. (2) 11 වන ගොඩ සරඹයටය.

(3) 9 වන ගොඩ සරඹයටය. (4) 12 වන ගොඩ සරඹයටය.

- **අංක 16 සිට 18 දක්වා පහත වගුව ඇසුරින් පිළිතුරු සපයන්න.**

| පේළිය | 1 තීරුව | 2 තීරුව | 3 තීරුව | 4 තීරුව |
|---|---|---|---|---|
| A | මදුරුව | රවීන්ද්‍රනාත් තාගෝර්තුමා | කරදිය | පණීභාරත |
| B | ග්‍රහ අපලය | මහේෂ් උමගලීය | සිසී | ශාප්මෝචන් |
| C | අංජලිකා | මණ්ණඩිරාළ | ඩබ්ලිව්.ඩී. අමරදේව | චිත්‍රසේන |

16. කුඹිකතාව නිෂ්පාදනය හා රංග වස්ත්‍ර නිර්මාණය කළ ශිල්පීන් ඇතුළත් වරණය වන්නේ,

(1) C පේලියේ 1 තීරුව හා B පේලියේ 2 තීරුවේය.

(2) C පේලියේ 2 තීරුව හා C පේලියේ 2 තීරුවේය.

(3) A පේලියේ 2 තීරුව හා C පේලියේ 4 තීරුවේය.

(4) B පේලියේ 1 තීරුව හා B පේලියේ 4 තීරුවේය.

17. කරදිය මුද්‍රානාට්‍යයට අයත් චරිත 02 ක් ඇතුළත් වරණය වන්නේ,

(1) A පේලියේ 1 තීරුව හා B පේලියේ 3 තීරුවේය.

(2) B පේලියේ 3 තීරුව හා B පේලියේ 4 තීරුවේය.

(3) B පේලියේ 3 තීරුව හා C පේලියේ 2 තීරුවේය.

(4) C පේලියේ 2 තීරුව හා A පේලියේ 1 තීරුවේය.

18. කොළඹ රීගල් නෘත්‍ය ශාලාවේදී වේදිකා ගත වූ මුද්‍රා නාට්‍ය ඇතුළත් වරණය වනුයේ,

(1) A පේලියේ 3 තීරුවේය. (2) B පේලියේ 4 තීරුවේය.

(3) B පේලියේ 1 තීරුවේය. (4) A පේලියේ 1 තීරුවේය.

19. උඩරට නර්තනයේ ප්‍රධාන ඇඳුම් කට්ටලයට අයත් කොටස් 02 කි,

(1) අවුල්හැරය හා කාගුල් තොප්පිය. (2) ඉනහැඩය හා හැඩකැල්ල

(3) ගෙජ්ජි හා හගලය. (4) සිබා බන්ධනය හා අවුල්හැරය.

20. කොහොඹා කංකාරි ශාන්ති කර්මයේ නර්තන අංග 02 කි,

(1) අස්නේ හා දෙවොල් (2) මඩුපුරය හා පත්තිනි

(3) ආවැන්දුම හා අස්න ය. (4) යහන් දැක්ම හා මුදුන් තාලය.

21. දොංජිංත ගත දොංත වට්ටමේ තාලරූපය වනුයේ,

(1) මාත්‍රා 2 + 3 තාලයටය. (2) මාත්‍රා 2 + 4 තාලයටය.

(3) මාත්‍රා 3 + 3 තාලයටය. (4) මාත්‍රා 3 + 4 තාලයටය.

22. දෙවොල් මඩුවට හා පහන් මඩුවට අයත් නාට්‍යමය පෙළපාලි 02 ක් වන්නේ,

(1) උෟරා යක්කම හා අඹ විදමන.

(2) දෙවොල් ගොඩ බැසීම හා ගබඩා කොල්ලය.

(3) ඇත් බන්ධනය හා රාමා මැරීමය.

(4) මී බන්ධනය හා වැදි යක්කමය.

23. දොං දොං ජිං ජිං ගජිගත යන බෙර පදයට ගැලපෙන තාලරූපය වනුයේ,

(1) මාත්‍රා 3 + 4 තාලයටය. (2) මාත්‍රා 2 + 4 තාලයටය.

(3) මාත්‍රා 2 + 3 තාලයටය. (4) මාත්‍රා 4 + 4 තාලයටය.

24. අභිනය දර්පනය නම් කෘතිය රචනා කරන ලද්දේ,

(1) භරත මුනිවරයා විසිනි. (2) නන්දිකේශ්වරයන් විසිනි.

(3) රවීන්ද්‍රනාත් තාගෝර් විසිනි. (4) රාම් ගෝපාල් විසිනි.

25. ආහාර්‍ය අභිනයේ ප්‍රධාන කොටස් දෙක වනුයේ,

(1) අංග රචනය හා ගීතය යි. (2) අංග රචනය හා වෙස් මෝස්තරය.

(3) අංග රචනය හා හැගීම් ය. (4) අංග රචනය හා හස්තමුද්‍රාය.

26. දෙසුළු මැදුම් තුන්තිත ප්‍රස්ථාර කර දැක්වීමේ දී සංකේත භාවිතා කරනුයේ,

(1) / / ^ යනුවෙනි. (2) / ^ / යනුවෙනි. (3) ^ ^ / යනුවෙනි. (4) ^ / ^ යනුවෙනි.

27. කුද ගජිගත / / / කුද තා මෙම කස්තිරම නර්තනය කරනු ලබන්නේ,

(1) මාත්‍රා 2 + 3 තාලයටය. (2) මාත්‍රා 3 + 3 තාලයටය.

(3) මාත්‍රා 3 + 4 තාලයටය. (4) මාත්‍රා 2 + 4 තාලයටය.

28. ''තණ්හා ආශා'' යන ඉගිනළුව නිර්මාණය කළේ,

(1) මිරැන්ඩා හේමලතා මහත්මියයි. (2) වජිරා චිත්‍රසේන මහත්මියයි.

(3) අංජලිකා චිත්‍රසේන මහත්මියයි. (4) ශ්‍රියානි රාජපක්ෂ මහත්මියයි.

29. ''බර අත්ගෙන කගින් ......'' යන කවි පදයේ ඉතිරි කොටස වන්නේ,

(1) දෙපළුව අසුරසෙන් (2) ඇත කොන්තවි වලින්

(3) බලයුත් සැම නිරිඳුන් (4) සැවුලා නම් එයින්

30. ''කාකු තක්කුං තරිකිට තකුද තත්ජෙං'' ..... යන අඩව්ව නටනු ලබන්නේ,

(1) සිංහරාජ වන්නමටය. (2) මුසලඩි වන්නමටය.

(3) වෛරොඩි වන්නමටය. (4) සැවුලා වන්නමටය.

31. විලම්භ ලයෙහි සිව්ගුණය හා මධ්‍ය ලයේ දෙගුණක වේගය මෙසේ හඳුන්වනු ලැබේ,

(1) විලම්භ ලය (2) මධ්‍ය ලය (3) දෘත ලය (4) ත්‍රිවිධ ලය

32. සොකරි ගැමි නාටකයේ දී ගායනය සඳහා යොදා ගන්නා වූ සරල බෙර පදයකි,

(1) කුදගත ගත දොං (2) දොදොංත තකු දොං

(3) කුදං ගතට දොං (4) දොං ජිජි ගත

33. ගැට බෙරයේ දකුණු ඇස ආරක්ෂා කර ගැනීම සඳහා යොදා ගන්නා උපකරණයකි,

(1) සුරත් තට්ටුව (2) හයි තට්ටුව (3) කන් වරය (4) බෙර ලනුව

34. අතීතයේ දී සෙබළුන්ගේ ධෛර්යය ශක්තිය හා ජීවය ඇති කිරීම සඳහා වාදනය කර ඇත්තේ,

(1) වඳ බෙරය (2) අණ බෙරය (3) රණ බෙරය (4) මළ බෙරය

35. ළමයකුගේ චින්තනය, ක්‍රියාව, චර්යා රටා නිරීක්ෂණය කිරීමෙන් ලබාගන්නා තොරතුරු අනුව නිගමන වලට එළඹිය හැකි වන්නේ පහත ඒවායින් කුමක් පදනම් කරගෙනද?

(1) චර්යා ප්‍රතිචාර (2) මානසික සවස්ථතාව

(3) චින්තන වේගය (4) විචාර බුද්ධිය

36. ජන ගායනා වල දැකිය හැකි මූලික ලක්ෂණයකි,

(1) සංකීර්ණ බව (2) පොදු බව (3) සාම්ප්‍රදායික බව (4) සරල බව

37. ගැටබෙරයේ ඇසෙහි විශ්කම්භය වන්නේ,

(1) විග්ගුස්සකි. (2) තුන් වියතකි.

(3) තුන් වියත් තුන් ගුලකි. (4) වියතකි.

38. කොහොඹා කංකාරි ශාන්ති කර්මයට පමණක් ආවේනික වූ චාරිත්‍රයකි,

(1) කප් සිටුවීම (2) හගල යැදීම (3) මඩු පේ කිරීම (4) මිල්ල කැපීම

39. උඩරට නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන ඇඳුම් කට්ටලය ලෙස හඳුන්වන්නේ,

(1) වෙස් ඇඳුම් කට්ටලයයි. (2) පබළු ඇඳුම් කට්ටලයයි.

(3) නෛයඩි ඇඳුම් කට්ටලයයි. (4) බෙර ඇඳුම් කට්ටලයයි.

40. ශ්‍රී වීරපරාක්‍රමබාහු රජතුමාට කොහොඹා කංකාරි ශාන්ති කර්මයක් කළ බව සඳහන් වන්නේ,

(1) කුවේනි අස්නේය. (2) සිහබා අස්නේය.

(3) දඹදෙණි අස්නේය. (4) දළදා සිරිතේය.

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# තෙවන වාර පරීක්ෂණය 2020

**10 ශ්‍රේණිය** **නර්තනය - II** **කාලය පැය 02 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

සැලකිය යුතුයි ඃ

- පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

(01) හිස්තැන් සඳහා නිවැරදි පිළිතුරු සපයන්න.

(i) මාත්‍රා $1\hat{2}/1'2\,3\,4$ තාල රූපයට නර්තනය කළ හැකි වන්නමකි ........................................ වන්නම.

(ii) දොළොස් වන ගොඩ සරඹය ........................................................ නමින් හැඳින්වේ.

(iii) ''දේසේ සිට ආ එගුරු මහල්ලා'' .......................................... යන කවිය සොකරි නාටකයේ .......................................... විසින් ගායනා කරනු ලබයි.

(iv) සතර අභිනයට අනුව නර්තනයේ භාවමය හැඟීම් ප්‍රකාශ කරන අභිනය වන්නේ .......................................... අභිනයයි.

(v) පහතරට වන්නම් ...................................................................... වන්නම් ලෙස හඳුන්වයි.

(vi) ජීවන වෘත්තීන් සම්බන්ධ නර්තන නිර්මාණයකදී පැල සිටුවීම, දළු වියලීම, කුඩුකර ගැනීම යන ක්‍රියාකාරකම් .......................................... නැටුමේදී (කර්මාන්තයේදී) දක්නට ලැබේ.

(vii) රොබට් ජුලියන්හි ඇතුළු පිරිස සංගීතය සැපයූ මුද්‍රා නාට්‍ය ............................................................ වේ.

(viii) කුණ්ඩලකේශී හා සුදෝසුදු යන මුද්‍රා නාට්‍ය නිෂ්පාදනය කරනු ලැබුවේ .......................................... මහතා විසිනි.

(ix) කථකලි නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන ගායකයා .......................................... වන අතර අත්වැල් ගායකයා හෙවත් සහය ගායකයා .......................................... ලෙස හැඳින්වේ.

(x) නර්තන කලාව පිළිබඳ ඓතිහාසික තොරතුරු අනාවරණය කර ගත හැකි මූලාශ්‍ර 02 ක් නම් කරන්න.

1. .................................................... 2. ....................................................................



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

(02) (i) ඔබ උගත් නර්තන සම්ප්‍රදායට අයත් බෙර පදයක් මාත්‍රා 4 + 4 තනි තිතට ප්‍රස්තාර කරන්න. (ල.04)

(ii) මාත්‍රා 4 + 4 තනි තිතට අයත් වන්නමක කවිපද දෙකක් ප්‍රස්තාර කරන්න. (ල.04)

(iii) මාත්‍රා 2 + 4 තාල රූපයට අයත් වන්නමක අඩව්ව ප්‍රස්තාර කරන්න. (ල.04)

(03) පහත සඳහන් මාතෘකා අතරින් තුනක් පිළිබඳව කෙටි සටහන් ලියන්න. (ල.12)

(i) ඔංචිලි වාරම් කවි

(ii) ගැටබෙරය

(iii) මිරැන්ඩා හේමලතා

(iv) විශ්මය නමැති ස්ථායිභාවය

(04) (i) උඩරට, පහතරට, සබරගමු ප්‍රධාන ශාන්තිකර්ම තුනට පොදු වූ පූර්ව චාරිත්‍ර 02 ක් නම් කරන්න. (ල.04)

(ii) කොහොඹාකංකාරි ශාන්තිකර්මයේ ප්‍රධාන වාදන අවස්ථා දෙකක් පිළිබඳව හැඳින්වීමක් කරන්න. (ල.04)

(iii) ශාන්තිකර්ම තුනේම කථා පුවත් තුළින් සමාජයට ලබාදෙන යහපත් ආකල්ප පිළිබඳව විස්තර කරන්න. (ල.04)

(05) රූප සටහන ඇසුරුකර ගනිමින් අසාඇති ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.



(i) ඉහත සඳහන් ගැමි නාටකය නම් කොට එයට අයත් කවියක් ලියන්න. (ල.04)

(ii) එම නාටකය පැවැත්වීමේ අරමුණු 02 ක් නම් කර රඟමඩලේ ස්වභාවය පිළිබඳව විස්තර කරන්න. (ල.04)

(iii) ගැමි නාටක සංරක්ෂණය කර ගැනීම සඳහා ඔබ ඉදිරිපත් කරන යෝජනා පිළිබඳව සාකච්ඡා කරන්න. (ල.04)

(06) (i) භාරතයේ ප්‍රචලිත නර්තන සම්ප්‍රදායන් දෙකක් නම් කොට එම නර්තන සම්ප්‍රදායන් ප්‍රචලිත ප්‍රදේශ දෙක බැගින් ලියන්න. (ල.04)

(ii) කථකලි නර්තන අංග දෙකක් නම් කොට එම සම්ප්‍රදායට අයත් වාද්‍ය භාණ්ඩයක් පිළිබඳව විස්තර කරන්න. (ල.04)

(iii) ''කථකලී නර්තන සම්ප්‍රදාය ආහාර්ය අභිනයෙන් පොහොසත්ය'' මේ පිළිබඳව විග්‍රහ කරන්න.(ල.04)

(07) (i) ''නර්තන කලාව හැදෑරීමෙන් මනා ආකල්ප වර්ධනයක් සිදුවේ.'' මේ පිළිබඳව ඔබේ අදහස් දක්වන්න. (ල.04)

(ii) නර්තන නිර්මාණයක් කිරීමේදී ලැබෙන අත්දැකීම් පෙළ ගස්වන්න. (ල.04)

(iii) අංග රචනය කිරීමේ විධික්‍රම දෙකක් පිළිබඳව විස්තර කරන්න. (ල.04)



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

## වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# තෙවන වාර පරීක්ෂණය 2020

## 10 ශ්‍රේණිය නර්තනය - ප්‍රායෝගික පරීක්ෂණය

සැලකිය යුතුයි :
- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

| ප්‍රශ්න අංකය | ක්‍රියාකාරකම | |
|---|---|---|
| (01) | ක්‍රියාකාරකම - ගායනය හා වාදනය | |
| | (i) කැමති ගායනය | 5 |
| | (ii) රබන් කවියක් ගයන්න | 5 |
| | (iii) කැමති බෙර සරඹයක් වාදනය | 5 |
| | (iv) මාත්‍රා 2 + 2 තනි තිතට බෙර පදයක් වාදනය කිරීම | 5 |
| | මුළු ලකුණු | 20 |
| (02) | ක්‍රියාකාරකම - සරඹ හා වට්ටම් නැටීම | |
| | (i) 6 වන ගොඩ සරඹය නැටීම | 10 |
| | (ii) කස්තිරම | 10 |
| | දොං ජිංත ගත දොංත වට්ටම පළමු පදය කස්තිරම, අඩව්ව | |
| | මුළු ලකුණු | 20 |
| (03) | ක්‍රියාකාරකම - වන්නම් නැටීම | |
| | (i) සිංහරාජ වන්නම සම්පූර්ණයෙන් නටන්න | |
| | මුළු ලකුණු | 20 |
| (04) | ක්‍රියාකාරකම - ගැමි හා ජීවන වෘත්තීන් හා බැඳි නර්තන | |
| | (i) කැමති ගැමි නැටුමක් | |
| | ධීවර / මැටි / පතල් / කොහු / කෘෂි කර්මාන්තයක් ඇසුරින් නර්තනයක් | |
| | මුළු ලකුණු | 20 |
| (05) | ක්‍රියාකාරකම - නිර්මාණ කුසලතා | |
| | 1. විලකට අරක්ගත් යක්ෂයෙක් දිය බීමට එන සතුන් බිය වැද්දීම. | |
| | 2. තම දරුවන් ආහාර සපයාදෙන කුරුලු මවකි. | |
| | 3. දඩයක්කරුවෙක් කැලයේදී කුළු මීමෙකු සමග පොර බැඳ ජීවිතය ගලවා ගැනීම. කැමති නිර්මාණයක් | |
| | මුළු ලකුණු | 20 |
| | මුළු ලකුණු | 100 |

## පිළිතුරු පත්‍රය - I කොටස

01. ( 2 ) 02. ( 3 ) 03. ( 1 ) 04. ( 4 ) 05. ( 3 ) 06. ( 2 ) 07. ( 1 ) 08. ( 3 ) 09. ( 4 ) 10. ( 2 )
11. ( 4 ) 12. ( 1 ) 13. ( 3 ) 14. ( 1 ) 15. ( 4 ) 16. ( 1 ) 17. ( 3 ) 18. ( 2 ) 19. ( 4 ) 20. ( 3 )
21. ( 1 ) 22. ( 3 ) 23. ( 2 ) 24. ( 2 ) 25. ( 2 ) 26. ( 3 ) 27. ( 4 ) 28. ( 1 ) 29. ( 2 ) 30. ( 2 )
31. ( 3 ) 32. ( 4 ) 33. ( 1 ) 34. ( 3 ) 35. ( 2 ) 36. ( 4 ) 37. ( 1 ) 38. ( 2 ) 39. ( 1 ) 40. ( 2 )

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින් ලකුණු 40 යි.)

## II කොටස

(01) (i) සැවුලා වන්නම (ii) චන්ද්‍රිකා සරඹය (iii) ගුරුහාමි
(iv) සාත්වික (v) සිංදු වන්නම් (vi) තේ දළු නැටුම
(vii) කුඹි කතාව (viii) නිමල් වෙල්ගම
(ix) 1. පොන්නානී 2. සිංකිටි / සිංගිඩි
(x) 1. වංශකතා 2. සෙල්ලිපි, සාහිත්‍ය මූලාශ්‍ර, දේශාටන වාර්තා යනාදිය

(02) (i)

| 1́ | 2 | 3 | 4 | 1́ | 2 | 3 | 4 | 1́ | 2 | 3 | 4 | 1́ | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| දො | දොං | - | ත | ත | කු | දොං | - | දො | දොං | - | ත | ත | කු | දොං | - |

නිවැරදිව තාල සංඥා ල. 2 ප්‍රස්තාරකරණයට ල. 2 (ලකුණු 04 යි.)

(ii)

| 1́ | 2 | 3 | 4 | 1́ | 2 | 3 | 4 | 1́ | 2 | 3 | 4 | 1́ | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| + | ත | තත් | ත | තෙ | ත | තිත් | - | - | ද | තත් | ත | තෙ | ත | තිත් | - |
| + | ද | තත් | ත | තෙ | ත | තිත් | - | - | ද | තත් | ත | තෙ | ත | තිත් | - |
| + | ත | තත් | ත | තෙ | ත | තිත් | - | - | ද | තත් | ත | තෙ | ත | තිත් | - |
| + | ද | තත් | ත | තෙ | ත | තිත් | - | - | දුං | තා | - | තා | - | - | - |

නිවැරදිව ආවර්ත සහ තාල සංඥා ල. 2 ප්‍රස්තාරකරණයට ල. 2 (ලකුණු 04 යි.)

(iii)

| 1̂ | 2 | 1́ | 2 | 3 | 4 | 1̂ | 2 | 1́ | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ජෝං | - | තත් | - | තත් | - | ජෝං | - | තත් | - | තත් | - |
| ජෝං | - | තත් | - | තත් | - | ජෝං | - | තා | - | - | - |
| ජෝනු | - | තත් | - | තත් | - | ජෝනු | - | තත් | - | තත් | - |
| ජේනු | - | තත් | - | තත් | - | ජේනු | - | තා | - | - | - |
| ජෝං | - | තත් | - | තත් | - | ජෝං | - | තා | - | - | - |
| ජෝං | - | තත් | - | තත් | - | ජෝං | - | තා | - | - | - |
| ජේං | - | තා | - | - | - | ජේනු | - | තා | - | - | - |
| ද්‍රෙහො | ගුඹ | තා | - | - | - | ද්‍රෙහො | ගුඹ | ගත | ත | කු | ද |
| ද්‍රෙහො | ගුඹ | තා | - | - | - | | | | | | |

නිවැරදිව ප්‍රස්තාරය සහ තාල සංඥා ල. 2 ප්‍රස්තාරකරණයට ල. 2 (ලකුණු 04 යි.)

**පිළිතුරු පත්‍රය - ඉතිරි කොටස**

(03) (i) ඔංචිලි වාරම්
- * අවුරුදු කාලයේ දී කරන ක්‍රීඩාවකට මේවා ගයන බව.
- * කතුරු ඔංචිල්ලා, වැල් ඔංචිල්ලා, රෑහැන් ඔංචිල්ලා, බඹර ඔංචිල්ලා, කුඩු ඔංචිල්ලා වැනි ඔංචිලි වර්ග පැදීමට මෙම කවි ගයන බව.
- * කවියක් ලියා තිබීම.
- * ගැහැණු පිරිමි භේදයකින් තොරව ඔංචිලි පැදීමේදී ගැයීම.
- * තුන් සරණ, බුදු ගුණ ආදිය ඇතුළත් වන බව.
- * විනෝදාස්වාදය සඳහා ගැයීම. (ආදී කරුණු 04 ලිවීමට ලකුණු 04)

(ii) ගැට බෙරය -
- * උඩරට නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩයයි.
- * බෙරයෙහි දිග / බෙර ඇසෙහි ප්‍රමාණය
- * යොදා ගන්නා දැව
- * යොදා ගන්නා හම් ආදී වශයෙන් (ආදී කරුණු 04 ලිවීමට ලකුණු 04)

(iii) මිරැන්ඩා හේමලතා -
- * 1938 කැලණියේ දළුගම උපත ලැබීම.
- * රජයේ ලලිත කලායතනයේ අධ්‍යාපනය ලැබ ආඩියාර්හි කලා ක්ෂේත්‍රම්හි අධ්‍යාපනය ලැබීම.
- * අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රථම අධ්‍යක්ෂක ධූරය දැරීම.
- * ගිරාගම ගුරු විද්‍යාලය, කටුකුරුන්ද වැනි ආයතන මගින් ගුරුවරුන්ට අධ්‍යාපනය ලබාදීම. (ආදී කරුණු 04 ලිවීමට ලකුණු 04)

(iv) විශ්මය නමැති ස්ථායි භාවය -
- * භරතමුණිගේ නාට්‍ය ශාස්ත්‍රයෙහි රස අටක් සහ භාව 8 ක් හඳුන්වා දෙයි.
- * රස රට නිපදවීම සඳහා ස්ථායිභාව 08 ක් ඇත.
- * භාවය පෙරටුකොට රස උපදී.
- * අද්භූත නමැති රසය විශ්මය නමැති ස්ථායී භාවය මුල් කොටගෙන උපදී. (ආදී කරුණු 04 ලිවීමට ලකුණු 04)

(මාතෘකා 3 ක් විස්තර කිරීමට ලකුණු 4 බැගින් ලකුණු 12 යි.)

(04) (i) කප් සිටුවීම / මඩු පේ කිරීම ආදී වශයෙන් චාරිත්‍ර විධි 02 ක් ලිවීමට (ලකුණු 04)

(ii) මඟුල් බෙර වාදනය -
- * පූජාර්ථය මුල් කරගනිමින් වාදනය කෙරේ.
- * දේව පදය, ගුරු පදය සහ වට්ටම් 03 කින් සමන්විත වේ.
- * ශාන්තිකර්ම ආරම්භවන්නේ මඟුල් බෙර වාදනයෙනි.
- * සියලුම බෙර වාදන ශිල්පීන් සහභාගී වේ.
- * අයිලය ඉදිරියෙහි වාදනය කරනු ලැබේ.

අත්‍යා බෙර වාදනය -
- * තමන්ගේ දක්ෂතාවයන් ප්‍රදර්ශනය කිරීම දක්නට ලැබේ.
- * යුගල වශයෙන් වාදනයේ යෙදේ.
- * විවිධ තාල රූප වලින් යුත් වට්ටම් හතරකින් සමන්විත වේ.
- * දැනුම, මතකය, තාල අවබෝධය හා වාදන හැකියාව මැන බැලේ.

වාදන අවස්ථා 02 ක් නම් කිරීමට - ල.02, විස්තර කිරීමට - ල.02, මුළු ලකුණු 04

(iii) කොහොඹා කංකාරිය -
- * තමාගේ දියුණුවට අත දුන් අය අමතක කිරීම නොමනා ක්‍රියාවකි.
- * දෙමාපියන්ගේ වැරදි තීරණ නිසා දරුවන්ට ලැබෙන ප්‍රතිවිපාක.
- * වෛරයෙන් වෛරය නොසන්සිඳෙන බව මෙවැනි ක්‍රියා කිරීමෙන් සමාජයට සිදුවන හානි පිළිබඳව කියවේ.

**පිළිතුරු පත්‍රය - ඉතිරි කොටස**

දෙවොල් මඩුව පහන් මඩුව -
* සත්ව හිංසනය නුසුදුසු ක්‍රියාවකි.
* තමා ජීවිතයට ප්‍රිය කරන්නා සේම අන්‍යයින්ද, සියළු සත්වයෝ ජීවිතයට ප්‍රිය කරති.
* මිනිසාට සත්වයාට මෙන් නොව ඉවසීම පුගුණ කළ යුතු බව.
* සත්ව හිංසනය මෙලොවදීම ප්‍රතිවිපාක දෙන අකුසල කර්මයක් බව. එනිසා වෛරය, සත්ව හිංසාව නොකර සිටිය යුතු බව ආදී කරුණු විස්තර කොට ඇත්නම්. (ල. 04)

(05) (i) සොකරි ගැමි නාටකය වශයෙන් නම් කිරීම - ල.02
කවියක් ලිවීමට - ල.02
මුළු ලකුණු 04

(ii)
* සශ්‍රීකත්වය වර්ධනය කිරීම.
* සමෘද්ධිය පැතීම.
* ප්‍රජාර්රථය
* විනෝදාස්වාදය
* සංරක්ෂණ කටයුතු
* අධ්‍යාපනික කටයුතු ආදිය ඇත්නම් ලකුණු 02.

රඟමඩල -
* කමත රංගභූමිය ලෙස සකසා ගනී.
* රඟ මඬල මැද වංගෙඩියක් මුනින් අතට නමා ලන්තෑරුමක් තබා ඇත.
* රඟමඩලෙහි ගෙඩි සහිත අඹ අත්තක් ඇත.
* පත්තිනි දෙවියන් උදෙසා පහන් පන්තු කිරීමට යහනක් තනා ඇත.
* පහන් පැල හතරක් ඇත.
* බෙර වාදකයෝ පසෙකින් සිටිති.

මෙසේ විස්තර කොට ඇත්නම් කරුණු 04 කට ලකුණු 02.

(iii) සංරක්ෂණය කර ගැනීමේ යෝජනා -
* සෑම වසරකට වරක් සොකරි රඟදැක්වීම.
* ගැමි නාටක පිළිබඳව ග්‍රන්ථ රචනා කිරීම.
* සොකරි ශ්‍රව්‍ය, දෘශ්‍ය පට සම්පාදනය කිරීම.
* ගැමි නාටක පිළිබඳව පුවත්පත් සඳහා ලිපි රචනා කිරීම.
* ජනමාධ්‍ය මගින් සිංහල ගැමි නාටක පිළිබඳව වැඩසටහන් ප්‍රචාරය කිරීම.

(ආදී කරුණු 04 ක් ලිවීමට ලකුණු 04)

(06) (i) භරත - මද්‍රාසිය, තාන්ජෝරය, තමිල්නාඩුව
කථකලි - කේරළය, මලබාරය
කථක් - ලක්නව්, ගුජරාටි, රාජස්ථාන්, දිල්ලි, බෙනාරිස්
මණිපුරි - උත්තර භාරතීය මණිපුරි, ඇසෑම්
සම්ප්‍රදාය නම් කොට නර්තන අංග නම් කිරීම සඳහා ලකුණු 04.

(ii) නර්තන අංග දෙකක් නම් කිරීමට - ලකුණු 02
වාද්‍ය භාණ්ඩයක් පිළිබඳව විස්තර කිරීමට - ලකුණු 02
මුළු ලකුණු 04

(iii) වේශ නිරූපණ ක්‍රම නම් කිරීමට - ලකුණු 02
ඒවා හැඳින්වීමට, ඇඳුම් පැළඳුම්හි කොටස් නම් කිරීම - ලකුණු 02

**පිළිතුරු පත්‍රය - ඉතිරි කොටස**

(07) (i) මාතෘකාවට අදාළව කරුණු
- * සාමූහිකත්වය
- * අන් මත ගරු කිරීම
- * වාද්‍ය භාණ්ඩ සඳහා ගරු කිරීම
- * අන්‍යයන්ගේ අදහස්වලට ගරු කිරීම
- * විචාර ශක්තිය දියුණු වීම
- * ඉවසීම ප්‍රගුණ කිරීම
- * වැඩිහිටියන්ට ගරු කිරීම
- * සංස්කෘතික අංග ආරක්ෂා කිරීම

(වැනි කරුණු 04 ක් උදාහරණ සහිතව ලිවීමට ලකුණු 04)

(ii) මාතෘකාවට අදාළව කරුණු 04 ක් ලිවීමට - ලකුණු 04

(iii) ස්වභාවික අංග රචනය, චරිතාංග අංග රචනය, ශෛලිගත අංග රචනය, විකාරරූපී අංග රචනය
යන ක්‍රම 02 ක් ලිවීමට - ලකුණු 02
ක්‍රම 02 ක් හැඳින්වීමට - ලකුණු 02
මුළු ලකුණු 04

(07) (i) කායික සාධක / මානසික සාධක

කායික සාධක

මානසික ස්වස්ථතාව සඳහා කායික නිරෝගීකම ප්‍රබල සාධකයකි. මේ මගින් මාංශ පේශිවල ක්‍රියාකාරීත්වය, ලේ ගමනාගමනය, අස්ථි මනා ලෙස ක්‍රියාකිරීම, සමබරතාවය, ඇගේ හැඩය යන කරුණු

මානසික සාධක

මානසික නිරෝගී බව, පුද්ගල සමබරතාවය, ආහාරපාන, අධික පීඩන, දෛනික ක්‍රියාවලීන් බලපායි. (ලකුණු 04)

(ii)
- * ළමයා හැසිරෙන ආකාරය
- * සමාජයට අනුගත වීම
- * එම වයස් කණ්ඩායම් හා ගැළපෙන ආකාරය ප්‍රදර්ශනය
- * වයසට ගැළපෙන පෞරුෂ වර්ධනය
- * තමන් පිළිබඳව ධනාත්මකව අභිමානයක් තිබීම
- * සෑමවිටම අලුත් දේ සෙවීම
- * කණ්ඩායම් වශයෙන් කටයුතු කිරීම
- * අන් අදහස්වලට ගරු කිරීම

යන කරුණු පහක් තිබේනම් (ලකුණු 04)

(iii)
- * නර්තනය ඉගැන්වීම් ඉගෙන ගැනීම
- * පුහුණු වීම, රසවිඳීම යන කරුණු
- * ආගමික පරිසරයක් තුළින් කායික, මානසික, හික්මීම ඇතිවේ.
- * ගුරුවරයාට ආචාර, සමාචාර කිරීම
- * වැඩිහිටි ශිල්පීන් අන්‍යෝන්‍ය ආචාර සමාචාර කිරීම
- * සාරධර්ම පද්ධතියක් උරුම කර දිය හැකිය
- * අංග, ප්‍රත්‍යංග, උපාංග හසුරුවන්නේ කෙසේද යන්න මනා ලෙස ඉගෙන ගැනීම යනාදී කරුණු (ලකුණු 04)